කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය - දකුණු පළාත
முகாமைத்துவ அபிவிருத்தி பயிற்சி நிலையம் - தென் மாகாணம்
Management Development & Training Institute - Southern Province
වක්වැල්ල, ගාල්ල. வக்வெள்ள,காலி. Wakwella, Galle.
MDTI SP
Success through the Management and Development

මගේ අංකය. / எனது இல. / My No. MDTI-SP/TU/01
ඔබේ අංකය. / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2025.03.12

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සියලුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>දෙමළ භාෂා ප්‍රවීණතාවය පාඨමාලා පැවැත්වීම</u>**

"රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම" ට අදාළ අංක 18/2020 හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර ව රාජ්‍ය නිලධාරීන් සම්පූර්ණ කර ගත යුතු භාෂා ප්‍රවීණතා මට්ටම් අනුව, දෙමළ භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීමට දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය විසින් කටයුතු සංවිධානය කර ඇති බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව **ප්‍රාථමික/ ද්විතියික සේවා මට්ටමේ නිලධාරීන් සඳහා අදාළ වන පැය 100/ 150 දෙමළ භාෂා පාඨමාලා** පහත පරිදි පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

| අනු අංකය | වැඩසටහන් අංකය හා නම | වැඩසටහන් පවත්වනු ලබන දින |
|---|---|---|
| 01 | පැය 100 දෙමළ භාෂා පුහුණුව - සඳුදා කණ්ඩායම | 2025.03.17 සිට සඳුදා දිනවල |
| 02 | පැය 100 දෙමළ භාෂා පුහුණුව - අඟහරුවාදා කණ්ඩායම | 2025.03.18 සිට අඟහරුවාදා දිනවල |
| 03 | පැය 100 දෙමළ භාෂා පුහුණුව - බදාදා කණ්ඩායම | 2025.03.19 සිට බදාදා දිනවල |
| 04 | පැය 100 දෙමළ භාෂා පුහුණුව - බ්‍රහස්පතින්දා කණ්ඩායම | 2025.03.20 සිට බ්‍රහස්පතින්දා දිනවල |
| 05 | පැය 150 දෙමළ භාෂා පුහුණුව - සිකුරාදා කණ්ඩායම | 2025.03.21 සිට සිකුරාදා දිනවල |

03. මෙම දෙමළ භාෂා පාඨමාලා සඳහා සහභාගී කරවිය යුතු පුහුණුලාභීන්ගේ නාම ලේඛන මේ සමඟ ඔබ වෙත යොමු කරන අතර, **<u>අදාළ නිලධාරීන් නියමිත දිනවල පමණක් සහභාගී කරවීමට කටයුතු කරන ලෙස</u>** කාරුණික ව දන්වා සිටිමි. **<u>නියමිත දින සහභාගී නොවන නිලධාරීන් හට වෙනත් දිනයක පුහුණු වැඩසටහනකට සම්බන්ධ වී පුහුණු දින ගණන ආවරණය කිරීමට අවස්ථාව නොදෙන බව</u>** අවධාරණය කරනු ලැබේ. (උදා-: සඳුදා දින කණ්ඩායමේ පුහුණුලාභියෙකු එදින සහභාගී නොවී එම සතියේ ම බදාදා දින පුහුණු වැඩසටහනට සම්බන්ධ වීමට අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා අවස්ථාව ලබා නොදේ.)

අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director 091 2 235386
සහකාර අධ්‍යක්ෂ / உதவிப் பணிப்பாளர் / Assistant Director 091 4 944023
www.mdtisp.lk
mdtisp@hotmail.com
කාර්යාලය / அலுவலகம் / Office 091 2 246716 091 4 944190
ෆැක්ස් / தொலை நகல் / Fax 091 2 246716 091 2 243280
පුහුණු අංශය / பயிற்சிக் கூடம் / Training Unit 091 3 907135 091 4 944021
Follow Us:
https://www.facebook.com/Management-Development-Training-Institute-Southern-Province-535188489903524/
https://twitter.com/MDTI_sp

04.	මෙම පුහුණු වැඩසටහන් පෙ.ව. 9.00 ට ආරම්භ වී ප.ව. 4.00 ට අවසන් වීමට නියමිත අතර, සම්පූර්ණ පාඨමාලා කාලය තුළ රැඳී සිටිය යුතු වේ. තවද, මෙම පාඨමාලාව සඳහා සහභාගීවන අයට නොමිලේ ආහාරපාන සපයනු ලැබේ.

05.	ඒ අනුව, **ඔබ ආයතනය හා ඒ යටතේ පවතින සියලුම ආයතනවල අදාළ නිලධාරීන් මේ පිළිබඳ නොපමාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස** වැඩිදුරටත් දන්වා සිටිමි.

06.	මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි

**ඒ.පී.ජී. රොෂාන් අමරසිංහ,**
**අධ්‍යක්ෂ,**
**කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය,**
**දකුණු පළාත.**